# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2007/37 - 2017 පෙබරවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2017.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 9/73 (xii)

**(469 වන අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක පනත**

2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ නියමය

(469 වන අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය ගාමිණී ජයවික්‍රම පෙරේරා වන මා විසින්, මේ නියමය මගින් එකී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ප්‍රදේශය අභයභූමියක් බවට ප්‍රකාශයට පත් කරනු ලබන අතර එම අභයභූමිය ''කොටුඅත්තාවල අභයභූමිය'' ලෙස හඳුන්වනු ලබන සහ සලකනු ලැබිය යුතු බවට, මේ නියමය මගින් තවදුරටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ගාමිණී ජයවික්‍රම පෙරේරා,
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍ය.

2017 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

*කොටුඅත්තාවල අභයභූමිය*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටියා වූ ද මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 1:50,000 සිතියම්වලට අනුකූල වන පරිදි SLD 99 ඛණ්ඩාංක පද්ධතියට අනුව ලබා ගෙන ඇති පහත සඳහන් GPS ඛණ්ඩාංක වලින් මායිම් වූ හෙක්ටයාර 35 ක භූමි ප්‍රදේශයකින් සමන්විත වන්නා වූ සම්පූර්ණ ප්‍රදේශය :

| | | |
|---|---|---|
| උතුරු මායිම | : | නැ 128078 උ 288076 වන ආරම්භක ලක්ෂ්‍යයේ සිට නැගෙනහිර දෙසට ඛණ්ඩාංක නැ 128063 උ 288198 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට ඊසාන දෙසට ඛණ්ඩාංක නැ 127897 උ 288242 වන ලක්ෂ්‍යය දක්වා ද වේ. |
| නැගෙනහිර මායිම | : | උතුරු මායිමේ අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ගිණිකොණ දෙසට ඛණ්ඩාංක නැ 127764 උ 288270 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට නිරිත දෙසට ඛණ්ඩාංක නැ 127508 උ 288352 වේ. |
| දකුණු මායිම | : | ඉහත නැගෙනහිර මායිමේ අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට වයඹ දෙසට ගමන් කිරීමේ දී හමුවන ඛණ්ඩාංක නැ 127409 උ 288295 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට බස්නාහිර දෙසට ඛණ්ඩාංක නැ 127476 උ 288380, නැ 127565 උ 288450 නැ 127719 උ 288788 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට නිරිත දෙසට ඛණ්ඩාංක නැ 127911 උ 288748 වන ලක්ෂ්‍යය දක්වා ද වේ. |
| බස්නාහිර මායිම | : | ඉහත දකුණු මායිමේ අවසානයට සඳහන් කළ ලක්ෂ්‍යයේ සිට ඊසාන දෙසට ඛණ්ඩාංක නැ 128160 උ 288751 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට ඊසාන දෙසට ඛණ්ඩාංක නැ 128359 උ 288445 වන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට ඊසාන දෙසට ආරම්භක ලක්ෂ්‍යය වන ඛණ්ඩාංක නැ 128078 උ 288076 වන ලක්ෂ්‍ය දක්වා ද වේ. |

1A - PG 3424 — 407 (2017/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*




03 - 382

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.